# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1900/8 - 2015 පෙබරවාරි මස 02 වැනි සඳුදා - 2015.02.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ ප්‍රධාන හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද ප්‍රාදේශීය සභාවල සභිකයින් සඳහා පහත සඳහන් දීමනා වලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති ඉන්ධන දීමනා සම්බන්ධයෙන් 2013.01.16 දින හා දුරකථන දීමනා සම්බන්ධයෙන් 2012.01.25 දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

රීති

01. මෙම රීති ප්‍රාදේශීය සභාවේ සභිකයින්ට දීමනා ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.

02. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1391/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් 2005.05.06 දින ප්‍රකාශිත දීමනාවලට අමතර වශයෙනි. ප්‍රාදේශීය සභාවේ සභිකයින්ට පහත සඳහන් පරිදි දීමනාවක් ඒ ඒ ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවිය හැකි වේ.

***ඉන්ධන දීමනාව*** -

මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා සභිකයන් වෙත මසකට රු.2500/- ක ඉන්ධන දීමනාවක් ගෙවීම

* මෙම දීමනාව අදාළ වන්නේ ප්‍රාදේශීය සභා සභිකයින් සඳහා පමණි.
* ප්‍රාදේශීය සභාවල සභාපති/උප සභාපති දැනට ඉන්ධන දීමනාවක් නොලබන්නේ නම් මෙම දීමනාව ලබාගත හැකිය. එකම කරුණක් සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකුට දීමනා දෙකක් ලබා ගැනීමට හිමිකමක් නැත.
* මහ නගර සභා / නගර සභාවලට මෙය අදාළ නොවේ.
* සෑම සභිකයෙකුටම උපරිමය රු. 2500/- කි. තමාට යතුරුපැදියක්/ත්‍රිවීලයක් / වෙනත් මෝටර් රථයක් නොමැතිනම් වෙනත් වාහනයක් භාවිතා කළ හැකි අතර බිල්පත් හෝ ලිපි ඉදිරිපත් කළ යුතුවේ. ඊට අදාළ ධාවන සටහන් ලබා ගත යුතුය.
  ප්‍රාදේශීය සභාවේ රාජකාරි සංවර්ධන කටයුතු අධීක්ෂණය සඳහා ධාවනය කරන ලද විස්තර ඉදිපත් කළ යුතුය.


1A - PG 2359 — 105 (2015/02)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*දුරකථන දීමනාව* -

ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරුන්ට රු. 1000/- ක දීමනාවක් ගෙවීම

* මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවලට පත්කර ඇති ප්‍රාදේශීය සභා සභිකයින් වෙත අදාළ පළාත් පාලන ආයතනයෙන් ප්‍රතිපාදන දැරීමේ පදනම මත මාසිකව රු. 1000/- ක දුරකථන දීමනාවක් ගෙවීම

සරත් ඒකනායක,
ප්‍රධාන හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
මධ්‍යම පළාත.

2015 ජනවාරි මස 16 වන දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

02 - 497/1

---

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ ප්‍රධාන හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 188 (i) ක.ක. හා 289 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් නියෝග පනවනු ලැබේ. මෙම නියෝගය 2013.02.17 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

නියෝග

මධ්‍යම පළාතේ මහනුවර මහ නගර සභාවේ නගරාධිපතිවරයාට, නියෝජ්‍ය නගරාධිපතිවරයාට හා නගර සභා සභිකයෙකුට මාසිකව පවත්වන ස්ථාවර කමිටු, අනු කමිටු, උපදේශක මණ්ඩල හා විශේෂ මහ සභා රැස්වීම් වලට සහභාගි වීම වෙනුවෙන් විශේෂ දීමනාවක් ඒ ඒ මහා නගර සභාවේ අරමුදලින් ගෙවීම. මෙම දීමනාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත 1391/25 හා 2005.05.06 දිනැති නියෝග වලට අතිරේකව ගෙවිය යුතුය.

| | | |
|---|---|---|
| * විශේෂ මහ සභා රැස්වීම් සඳහා | - | රු. 2000.00 |
| ස්ථාවර කමිටුවක් සඳහා | - | රු. 750.00 |
| අනු කමිටු හෝ උපදේශක මණ්ඩලයක් සඳහා | - | රු. 500.00 |

සරත් ඒකනායක,
ප්‍රධාන හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
මධ්‍යම පළාත.

2015 ජනවාරි මස 16 වන දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

02 - 497/2

## මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ ප්‍රධාන හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 188 (i) ක.ක. හා 289 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් නියෝග පනවනු ලැබේ. මෙම නියෝගය 2013.06.18 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

නියෝග

මධ්‍යම පළාතේ නුවරඑළිය මහ නගර සභාවේ නගරාධිපතිවරයාට, නියෝජ්‍ය නගරාධිපතිවරයාට හා නගර සභා සභිකයෙකුට මාසිකව පවත්වන ස්ථාවර කමිටු, අනු කමිටු, උපදේශක මණ්ඩල හා විශේෂ මහ සභා රැස්වීම් වලට සහභාගි වීම වෙනුවෙන් විශේෂ දීමනාවක් ඒ ඒ මහා නගර සභාවේ අරමුදලින් ගෙවීම. මෙම දීමනාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත 1391/25 හා 2005.05.06 දිනැති නියෝග වලට අතිරේකව ගෙවිය යුතුය.

| | | |
|---|---|---|
| * විශේෂ මහ සභා රැස්වීම් සඳහා | - | රු. 2000.00 |
| ස්ථාවර කමිටුවක් සඳහා | - | රු. 750.00 |
| අනු කමිටු හෝ උපදේශක මණ්ඩලයක් සඳහා | - | රු. 500.00 |

සරත් ඒකනායක,
ප්‍රධාන හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
මධ්‍යම පළාත.

2015 ජනවාරි මස 16 වන දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

02 - 497/3

---

## මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ ප්‍රධාන හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 188 (i) ක.ක. හා 289 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් නියෝග පනවනු ලැබේ. මෙම නියෝගය 2013.05.08 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

නියෝග

මධ්‍යම පළාතේ මාතලේ මහ නගර සභාවේ නගරාධිපතිවරයාට, නියෝජ්‍ය නගරාධිපතිවරයාට හා නගර සභා සභිකයෙකුට මාසිකව පවත්වන ස්ථාවර කමිටු, අනු කමිටු, උපදේශක මණ්ඩල හා විශේෂ මහ සභා රැස්වීම් වලට සහභාගි වීම වෙනුවෙන් විශේෂ දීමනාවක් ඒ ඒ මහා නගර සභාවේ අරමුදලින් ගෙවීම. මෙම දීමනාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත 1391/25 හා 2005.05.06 දිනැති නියෝග වලට අතිරේකව ගෙවිය යුතුය.

| | | |
|---|---|---|
| * විශේෂ මහ සභා රැස්වීම් සඳහා | - | රු. 2000.00 |
| ස්ථාවර කමිටුවක් සඳහා | - | රු. 750.00 |
| අනු කමිටු හෝ උපදේශක මණ්ඩලයක් සඳහා | - | රු. 500.00 |

සරත් ඒකනායක,
ප්‍රධාන හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
මධ්‍යම පළාත.

2015 ජනවාරි මස 16 වන දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

02 - 497/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.